# දීර්ඝ පා ගමන

චියැං කායි ෂෙක්ගේ හමුදාව නිතර නිතර කොමියුනිස්ට් පාක්ෂිකයන්ට හිරිහැර කිරීම නිසා මාඕ-සේ-තුං "දීර්ඝ පා ගමන"**(Long March)** සංවිධානය කෙළේ ය. 1934 ඔක්තෝබර් මස කියැංග්සි ප්‍රදේශයෙන් ආරම්භ වූ දීර්ඝ පා ගමන 1935 ඔක්තෝබර් මස කොමියුනිස්ට් මූලස්ථානය පිහිටි යොනාන් ප්‍රදේශයෙන් අවසන් විය. ගමනේ මුළු දුර සැතපුම් 6000 ක් පමණ විය. ගමනාරම්භයේ දී 90,000 ක් පමණ දෙනා සහභාගි වුවත් ගමන අවසාන වන විට රැඳී සිටියේ 20,000 ක් පමණි. එසේ ඉතිරි වූ සියලු දෙනා නියම කොමියුනිස්ට්වාදීන් බව මැන ගැනීමට මීට වඩා සාධකයක් අවශ්‍ය නැත. දැඩි බව, චිත්ත ධෛර්යය, කැපවීම යන ගුණාංගයෙන් යුතු නියම කොමියුනිස්ට්වාදීන් ලෙස මේ පිරිස හඳුනා ගත හැකි ය. මේ පා ගමන නිසා මාඕ-සේ-තුං චීන කොමියුනිස්ට් පක්ෂයේ අසහාය නායකයා බවට පත් විය. පා ගමන අවසන් වන විට විශාල ජන සහායක් කොමියුනිස්ට් පක්ෂයට ලැබෙන බව පැහැදිලි වන්නට විය. එහෙත් ප්‍රධාන නගර සහ ආර්ථික සම්පත් තිබුණේ සතුරන් අත ය. ටික දිනක් ගත වන විට වයඹ දිග චීන ප්‍රාන්තය ස්වාධීන කොමියුනිස්ට් ප්‍රාන්තයක් බවට පත් විය.

විධිමත් අයුරින් සංවිධානය වූ කොමියුනිස්ට් ආකෘතියේ බලපෑම ඇතිව එහි දේශපාලන ව්‍යුහය හා හමුදා ඒකක ව්‍යාප්ත වන විට මහජනතාව ඒ වෙත ආකර්ෂණය විය. නැන්කින් පාලනයට මේ ව්‍යුහය හඳුන්වා දුන්න ද ඔවුහු කිසිවිටෙකත් එය ක්‍රියාත්මක නො කළහ.

වයඹ දිග චීන ප්‍රාන්තයේ කොමියුනිස්ට් පාලකයෝ ඉඩම් ප්‍රශ්නය ඉක්මණින් විසඳීම සඳහා විශාල ඉඩම් කැබලිවලට වෙන් කොට ඉඩම් නොමැති අයට බෙදා දුන්හ. බදු කුලී අඩු කරන ලදී. මහජනතාවට ඉඩම් බෙදා දීම සඳහා ඉඩම් බැංකුවක් පිහිටුවන ලදී. වාරිමාර්ග ඉදි කළ අතර සමුපකාර සංවිධාන ගොඩනඟන ලදී. වගා කිරීමේ ක්‍රම ද නවීකරණය කෙරිණි. බෝග වර්ග පාලනය කරන ආකාරය ද ගොවීන්ට පැහැදිලි කොට දෙන ලදී. මේ අතර වාරයේදී ජපානය චීනය ආක්‍රමණය කෙළේ ය. එමඟින් කොමියුනිස්ට්වරුන්ගේ මෙන් ම ක්වෝමිංටාන්වරුන්ගේ පොදු සතුරා ජයග්‍රහණය කළ බව දක්නට තිබිණි. එම ජාතික ආපදා තත්ත්වය හමුවේ වුව ද පක්ෂ දෙක සමඟි කිරීමට දරන ලද සියලු ප්‍රයත්න අසාර්ථක විය.

දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වූ ක්‍රි.ව. 1939 වන විට ඊට හතළිස් වසරකට පෙර තිබූ තත්ත්වයට වඩා චීනය ශක්තිමත් තත්ත්වයක පැවතිණ. ජපනුන්ගේ දැවැන්ත යුද යන්ත්‍රණය යොදවා නැඟෙනහිර චීනයේ වෙරළබඩ පළාත් හා නගර ජපනුන් විසින් අල්ලා ගැනීමෙන් පසුව ඔවුන් ජාතිකවාදී ක්වෝමිංටාන් රජයට කියා සිටියේ චුං කිං දක්වා පසුබසින ලෙස ය. ජපන් සේනාවලට මුළු චීනය ම අල්ලා ගත නොහැකි විය. ඇමරිකා එක්සත් ජනපදය ජපානයට එරෙහි ව යුද්ධයට අවතීර්ණ වීමත් සමඟ ම මිත්‍ර පාක්ෂිකයන්ගෙන් චීනයට යුද ආධාර සැපයිණි.

ජාතිකවාදී ක්වෝමිංටාන්වරුන් සහ කොමියුනිස්ට්වාදීන් අතර දිගින් දිගටම පැවති ගැටුම්වලින් අවසානයේ මාඕ-සේ-තුංගේ නායකත්වයෙන් යුක්ත වූ කොමියුනිස්ට් පක්ෂය ජය ගත් අතර චියැං-කායි-ෂෙක් තම සහායකයන් සමඟ තායිවානයට පලාගොස් එහි බලය පිහිටුවා ගත්තේ ය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

ක්වෝමිංටාන්වරුන් සහ කොමියුනිස්ට්වරුන් අතර පැවති මතභේද පැහැදිලි කරන්න.

## චීනයේ කොමියුනිස්ට් පාලනය

- ජාතිකවාදී සේනා පරාජයට පත් වූ පසු කොමියුනිස්ට් නායකයෝ චීනයේ විශාල භූමි ප්‍රදේශයක බලය තහවුරු කොට ගැනීම සඳහා කටයුතු කළහ.
- 1949 ඔක්තෝබර් මාසයේ දී චීන මහජන ජනරජයක් පිහිටුවා ලූ බවත් අගනුවර පීකිං (බෙයි-ජිං) බවත් ප්‍රකාශයට පත් කරන ලදී.
- 1954 මහජන චීන ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් විය.
- එම ව්‍යවස්ථාව සෝවියට් දේශයේ ව්‍යවස්ථාවට සමාන විය.
- කොමියුනිස්ට් ආධිපත්‍යයට අනුකූලව පිහිටවනු ලැබූ "සමස්ත චීන මහජන කොන්ග්‍රසය" වටා බලය ඒකරාශි විය.
- පුද්ගල නිදහස , ස්ත්‍රී-පුරුෂ සමානත්වය, වයස අවුරුදු 18 ට වැඩි අයට ඡන්ද බලය හිමි වීම, දේපොළ අයිතිය එම ව්‍යවස්ථාවෙන් තහවුරු කොට තිබිණි.

කොමියුනිස්ට් පක්ෂය බලයට පත් වූ පසු ආර්ථික, සාමාජික හා සංස්කෘතික ප්‍රතිසංස්කරණ රැසක් ක්‍රියාත්මක විය. චීන විප්ලවය, චීන ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයකි. කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධානියා වූ මාඕ-සේ-තුං මාක්ස්වාදය චීනයේ ප්‍රශ්න විසඳීම සඳහා භාවිත කෙළේ එය චීන සම්ප්‍රදාය සමඟ සසඳා බලා නිගමනයට එළඹීමෙන් පසුව ය. තම අරමුණ කරා ගමන් කිරීමේ දී තිබූ ස්ථාවරභාවයත්, ක්‍රමෝපායන් සකස් කිරීමේ දී දැක් වූ ප්‍රායෝගික බව හා නිර්මාණශීලී බවත් ඉතා අපූරු ය. චීනයේ ශ්‍රේෂ්ඨ ඓතිහාසික උරුමයට ගරු කළ මාඕ-සේ-තුං "ජයග්‍රාහී" විප්ලවකාරී සම්ප්‍රදාය රැක ගත්තේ ය.

සුන්-යත්-සෙන් අගය කළ ඔහු, සුන්-යත්-සෙන් ගේ වැන්දඹුවට චීන මහජන සමූහාණ්ඩුවේ උප සභාපති පදවිය පිරිනැමී ය. මා-ඕ මාක්ස් වාදී නියමයක් වන පංති අරගලය පිළිගත් අතර 19 වන සියවසේ සිදු වූ තායි පෙං කැරැල්ල වැනි ගොවීන්ගේ අසාර්ථක කැරැලි හොඳින් අධ්‍යයනය කළේ ය. ගොවීන්ගේ සහාය ඇතිව සාර්ථක වූ මහා පරිමාණයේ විප්ලවයක් දියත් කළ ප්‍රථම නායකයා මාඕ-සේ-තුං ය. ගොවීන් අතුරින් පැන නැඟුණු ගොවි නායකයෝ විප්ලවයට මග පෙන්වූහ. මෙය ලෙනින්ගේ හා ස්ටාලින්ගේ න්‍යාය ධර්මය සමඟ නො ගැළැපේ. චීනයේ බිහිවූ සමාජය දසෝවියට් සමාජයට වඩා වෙනස් ය.

ගොවි, කම්කරු, සුළු ධනපති හා මධ්‍යම පංති යන සියලු කොටස්වල සහාය චීන කොමියුනිස්ට් පාලනයට ලැබිණි. සුළු ධනපති හා මධ්‍යම පංතියේ සහාය ලබා ගැනීම සාමාන්‍ය මාක්ස්වාදී ධර්මයෙන් බැහැරට යාමකි. එසේ වුව ද එම පංති දෙක සතුව තිබූ ආර්ථික බලය හා කාර්මික ඥානය යොදා නොගෙන ආර්ථික වර්ධනය ලබා ගැනීම අසීරු බව මාඕ-සේ-තුං ට පැහැදිලි විය.

නව රජය සමඟ වැඩ කිරීමට කැමැති ව්‍යාපාරිකයන්ට හා මධ්‍යම පංතියට එසේ කළ හැකි වුව ද ඔවුන්ගේ දේපල සියල්ල ම තාවකාලිකව රජයට භාරදිය යුතු විය. ඉන් පසු ව වුව ද ඔවුන්ගේ කාර්යය දැඩි ලෙස නිරීක්ෂණයට ලක් විය. ක්‍රි.ව. 1956 දී මධ්‍යම පංතියේ හිමිකම් ඉවත් කෙරිණි. මාඕ-සේ-තුං ඇතුළු මධ්‍යම කාරක සභාව රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කළ අතර රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ යතුර ඔහු අත විය. මෙහි දී මහජන හිතකාමී ආඥාදායකත්වය ක්‍රියාත්මක විය. මාඕ-සේ-තුං යටතේ චීනයේ කාර්මික ක්ෂේත්‍රයේ ඉතා සීඝ්‍ර වර්ධනයක් සිදු විය.

## මහා පිම්මක් ඉදිරියට

කාර්මීකරණය සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ද ශීඝ්‍ර වෙනස් වීම් ඇති විය. කෘෂිකර්මය හා බැඳුණු සමාජය ද වෙනස්වීම් වලට භාජනය විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රථම අදියර වූ ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් විශාල ඉඩම් හිමියන්ට ඉඩම් අහිමි විය. ඊට විරෝධය පෑ ඉඩම් හිමියන් මරා දැමූ අවස්ථා ද විය. සමුපකාර පදනමක් මත වගා කටයුතු කරන ලෙස ඉඩම් හිමි වූ නව ගොවි පංතියෙන් ඉල්ලා සිටියේ සම්පත් සියල්ල ගමක් හෝ දෙකක් ඒකාබද්ධ කොට රැස්කර තැබීමට අපේක්ෂා කළ බැවිනි.


රූපය 3.9 මා-ඕ- සේතුං මහතා

අනතුරුව සාමූහික ගොවිපොළවල් පිහිටුවී ය. ඒවායේ කටයුතු මෙහෙයවන ලද්දේ සාමාජිකයන් විසිනි. මේ ක්‍රමය ක්‍රි.ව. 1955-1957 අතර කාලය තුළ දී පුදුමාකාර වේගයකින් ඉදිරියට ගියේ ය. 90% ක් පමණ වූ අස්වැන්න සාමූහික පදනමක් මත රැස්

කෙරිණි. සාමූහික ගොවිපොළට ඇතුළු වූ ගොවීහු කැමැත්තෙන් ම සමුපකාර ක්‍රමයට සම්බන්ධ ව ක්‍රියා කළහ.

ක්‍රි.ව. 1959 දී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනයක් ඇති කිරීම සඳහා "මහා ඉදිරි පිම්ම" නම් වැඩසටහන හඳුන්වා දෙන ලදී. සමුපකාර ගොවිපොළවල් එකතු කොට විශාල කොමියුන සකස් කෙරිණි. ගොවිපොළවල් එක් කොමියුනයකට පමණක් නොව සමස්ත චීන ජනතාවට ම අයත් බව මෙහි දී අවධාරණය විය. කොමියුන පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රවල නිෂ්පාදනය වැඩි කොට ආර්ථික වර්ධනය වේගවත් කිරීම යි. එසේ වුවද භේද ගණනාවක් නිසා "මහා ඉදිරි පිම්ම" වැඩ සටහන අසාර්ථක විය.

"මහා ඉදිරි පිම්ම" අසාර්ථක වීම නිසා මාඕගේ දේශපාලන තත්ත්වය තරමක් දුර්වල විය. ක්‍රි.ව. 1959 දී සභාපති පදවිය අත්හැර දමා පසු පෙළ නායකත්වය පමණක් තබා ගනිමින් පක්ෂය තුළ තම බලය තහවුරු කර ගැනීමටත්, හමුදාවේ සහාය ලබා ගැනීමටත් කටයුතු කෙළේ ය. ඉන් පසු තම සතුරන්ට ක්‍රියාත්මක වීමට නොහැකි වන අයුරින් විප්ලවය වේගවත් කරමින් සංස්කෘතික විප්ලවයක් දියත් කරනු ලැබී ය.

නිර්ධන පංතියේ සංස්කෘතික විප්ලවයේ පසුබිම හා අරමුණු ඉතා සංකීර්ණ ය. සංක්ෂිප්ත ව දක්වන්නේ නම් එය රජයේ ප්‍රධානියා වන ලියෝ-ෂාඩ්-චි නියෝජනය කරන මධ්‍යස්ථවාදීන් හා මාඕ-සේ-තුං නියෝජනය කළ රැඩිකල්වාදීන් අතර පැවති බල තරගය යි.

## සංස්කෘතික විප්ලවය

සංස්කෘතික විප්ලවය ආරම්භ වීමත් සමඟ විවිධ චෝදනා යටතේ රාජ්‍ය නිලධාරීන් අත්අඩංගුවට ගැනිණි. තවත් අය තනතුරෙන් පහළට දැමී ය. මීට හේතු වශයෙන් කොමියුනිස්ට්වාදීන් ඉදිරිපත් කළ චෝදනා අතර "සංශෝධනවාදය" "පක්ෂ විරෝධී කටයුතු" "ධනවාදී මාර්ගයේ ගමන් කිරීම" යනාදිය ප්‍රධාන විය.

සංස්කෘතික විප්ලවයට දැඩි විරෝධතා එල්ල වන විට මාඕ තරුණ පෙළ දෙසට හැරිණි. "විප්ලවය ඉගෙන ගන්න. විප්ලව කිරීමෙන් විප්ලවය ඉගෙන ගන්න."යයි මාඕ පැවසීය. රටේ තිබූ සියලු පාසල් වසා දමා පාසල් සිසුන් යොදවා "රතු භට ආරක්ෂක හමුදා" පිහිටුවී ය. ක්‍රි.ව. 1966 අගෝස්තු මස පීකිං නගරයේ ප්‍රථම "රතු ආරක්ෂක හමුදාව" පිහිටුවන ලදී. තම ශක්තිය හා ධෛර්ය උපරිම මට්ටමෙන් යොදවා විප්ලවයේ සතුරන් මර්දනය කිරීමට මාඕ ක්‍රියා කළේ ය.

මාඕ-සේ-තුං ගේ චින්තනය දැඩි ලෙස පිළිගෙන ඒ අනුව කටයුතු කරන ලෙස ඔහු ජනතාවට කියා සිටියේ ය. කොමියුනිස්ට් සාමාජිකයන් හා සමාජිකයන් නොවන පිරිස් යන දෙකොටසම ඇතුළත් වන අන්දමින් විප්ලවකාරී කමිටු පිහිටුවා ඒ අය කර්මාන්තශාලා පළාත් හා ප්‍රාදේශිය ආණ්ඩු මෙන් ම මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු පවත්වා ගෙන යාම සඳහා යොදවන ලදී.

රැඩිකල් අරමුණු සාර්ථක කර ගැනීම සඳහා කළ මේ අරගලය හේතු කොට රට අරාජික තත්ත්වයකට පත් විය. ප්‍රධාන කර්මාන්තශාලාවල වැඩ වර්ජන ඇති විය. ප්‍රවාහනය අවුල් ජාලයක් බවට පත් විය. චීනය රාජ්‍යතාන්ත්‍රික වශයෙන් තනි විය. කොමියුනිස්ට් රටවල් පවා චීනය සමඟ තානාපති සබඳතා ඇති කර ගත්තේ නැත."රතු ආරක්ෂක භට හමුදාව හා විප්ලවකාරී" කැරලිකරුවෝ ක්‍රි.ව. 1968 දී ඇතැම් පළාත්වල සිවිල් යුද්ධ තත්ත්වයක් ඇති කළහ. මේ තත්ත්වය නිසා "මහජන විමුක්ති හමුදාව" කැඳවා රටේ තත්ත්වය සන්සුන් කිරීමට මාඕ-සේ-තුංට හා චෞ-එන්-ලායි ට සිදු විය. ඉන් අනතුරුව පක්ෂයේ අතිධාවනකාරී කොටස් පක්ෂයෙන් ඉවත් කරන ලදී. සංස්කෘතික විප්ලවයේ ප්‍රධාන උපදේශකයා වූ ලින්-පියා-ඕ මාඕ ගෙන් පසු පක්ෂයේ නායක තනතුරට නම් කොට සිටි නමුත් ඔහු සංස්කෘතික විප්ලවයේ චූදිතයකු බවට පත් විය. ඔහු සෝවියට් දේශයට පලා යමින් සිටිය දී ගුවන් අනතුරකින් මිය ගියේ ය.

## සංස්කෘතික විප්ලවයේ ප්‍රතිඵල

සියවස් ගණනාවක් තිස්සේ ස්ථාවරව පැවති චීන සමාජය සංස්කෘතික විප්ලවයෙන් පසු වෙනස් විය. ශීඝ්‍රයෙන් වැඩි වන ජන සංඛ්‍යාව පාලනය කිරීම සඳහා විවිධ දිරි දීමනා ලබා දුනි. කෘෂිකාර්මික හා කර්මාන්ත ක්ෂේත්‍රවල වර්ධනය ශීඝ්‍ර වූ අතර ජනතාවගේ ජීවන තත්ත්වය ද උසස් විය. කාන්තාවන්ට ද පිරිමින් හා සමාන ස්ථානයක් හිමි විය. නවීන ලෝකයට ගැළපෙන ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් සිදු කෙළේ ය. චීන අක්ෂර මාලාව ඉතා සංකීර්ණ වූ බැවින් පහසුවෙන් භාවිත කළ හැකි අක්ෂර මාලාවක් නිපදවා ගත්තේ ය. හුදකලාව සිටි චීනය, සෝවියට් දේශය, ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය ඇතුළු බොහෝ රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගන්නා ලදී. සෑම ක්ෂේත්‍රයක ම වර්ධනයක් ඇති කර ගත් චීනය වර්තමානයේ ලෝක බලවතකු බවට පත් විය. චීනයට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය ලැබීම නිදසුනක් ලෙස දැක්විය හැකිය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

1. දීර්ඝ පා ගමනට අදාළ පින්තූර රැස් කරන්න.
2. චීනයේ භූගෝලීය ලක්ෂණ දැක්වෙන සිතියමක් අඳින්න.
3. චියං-කායි-ෂෙක්, චෞ-එන්-ලායි, මාඕ-සේ-තුං, ක්වෝ මිංටාන්, කොමියුනිස්ට්වාදීන්, සංස්කෘතික විප්ලවය වැනි මාතෘකා පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා පොත් පිංචක් සකස් කරන්න.
4. චීන විප්ලවයේ ප්‍රධාන අවස්ථා සහ ඒවායෙහි සිදු වූ ප්‍රධාන දේශපාලන සිද්ධි ලැයිස්තුගත කරන්න.